Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

කොළඹදී, 2022 ඔක්තෝබර් 12

**නෙස්ලේ නෙස්ටොමෝල්ට්, 47වැනි ජාතික ක්‍රීඩා උළෙල බලගන්වයි**

හතළිස් හත්වැනි ජාතික ක්‍රීඩා උළෙල ඉකුත් සති අන්තයේ (ඔක්තෝබර් 8 සහ 9) ගම්පහදී මැරතන්, ඇවිදීමේ තරග සහ පාපැදි ධාවන තරග යන ඉසව් සමඟින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1500කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව ආරම්භ විය. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයත්, නෙස්ලේ ලංකා සමාගමේ ප්‍රමුඛතම සන්නාමයක් වන නෙස්ලේ නෙස්ටොමෝල්ට් එක්ව සංවිධානය කළ මෙම ක්‍රීඩා උළෙල හරහා මෙරට දක්ෂ යොවුන් ක්‍රීඩකයින් රැසකට සිය දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට මෙන්ම ජයග්‍රාහකයින්ට ජාතික ක්‍රීඩා සංචිතයට ඇතුළු වීමට ද වටිනා අවස්ථාවක් උදාවිය.

"සැබවින්ම ශ්‍රී ලාංකික සන්නාමයක් වශයෙන් ජාතික මැරතන් ශූරතාන වැනි ක්‍රීඩා ඉසව්වලට දායක වෙමින් ශ්‍රී ලංකාවේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බලගැන්වීමට හැකිවීම අපට විශාල අභිමානයක්. විශේෂයෙන්ම, ඔවුන්ට සිය පූර්ණ හැකියාවන්ට ළඟා වීම සඳහා අවස්ථාවක් සැපයීමට අපට විශාල සතුටක්. ඉදිරියේදීත් මෙවැනි වැඩසටහන් සඳහා දායක වෙමින් විවිධ පරම්පරා නියෝජනය වන පරිදි ප්‍රජාව තුළ ධනාත්මක වෙනසක් නිර්මාණය කිරීමට අපි කටයුතු කරනවා", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති- කිරි ආහාර අංශය, රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

වසර 35ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ දැවැන්තම මැරතන් තරගාවලි සඳහා අනුග්‍රාහකත්වය ලබාදුන් නෙස්ලේ නෙස්ටොමෝල්ට් ඉකුත් වසරේදී ජාතික මැරතන් ශූරතාවට ද සිය අනුග්‍රහය ලබාදුනි. මෙරට මැරතන් ක්‍රීඩකයින්ට ඉදිරි තරග සඳහා 100%ක් සූදානමින් සිටීමට සහාය වීමේ අරමුණින් ඔවුන්ට මූල්‍ය ආධාර, මලල ක්‍රීඩක පුහුණු කට්ටල මෙන්ම, වසරකට ප්‍රමාණවත් නෙස්ලේ නෙස්ටොමෝල්ට් නිෂ්පාදන ලබාදීමටත් පියවර ගැනුණි.

ඉකුත් ඔක්තෝබර් 8 සහ 9 දෙදින තුළ පැවැති ක්‍රීඩා ඉසව් 6ට අදාළ ප්‍රතිඵල මෙසේය:

මැරතන් පිරිමි – **(1)** ටී.එම්.රත්නපාල **(2)** ආර්.ඒ.පී.ඩී.අරුණසිරි **(3)** ඩබ්.එම්.එස්.කුමාර

මැරතන් කාන්තා – **(1)** එම්.එස්.පී.එම්.පෙරේරා **(2)** එච්.එම්.ඩබ්.ජී.ඩබ්.එම්.හේරත් **(3)** ඒ.එල්.එස්.ඩී.ලියනගේ

ඇවිදීම පිරිමි– **(1)** ආර්.එම්.ඩී.රුක්මාල් **(2)** එච්.එම්.එස්.ආර්.හේරත් **(3)** පී.එච්.එස්.ලක්මාල්

ඇවිදීම කාන්තා – **(1)** යූ.වී.කේ.මධුනිකා **(2)** ටී.එච්.ඩී.දිල්හානි **(3)** පී.බී.ගයානි

පාපැදි ධාවන පිරිමි – **(1)** එච්.ඒ.ඩී.මැඩොන්සා **(2)** ආර්.ටී.සී.දයානන්ද **(3)** ඩී.එස්.නුගේරා

පාපැදි ධාවන කාන්තා – **(1)** කේ.ඒ.එස්.එන්.පෙරේරා **(2)** ඩබ්.ඒ.ආක්ෂා සඳමිණි **(3)** වී.එන්.කුමාරසිංහ

එදිනම, සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙල යටතේ සමස්ත ලංකා පාසල් මිනි මැරතන් තරගාවලිය ද පැවැත්වුණි. අධ්‍යාපන අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද මෙම ක්‍රීඩා උත්සවයට ද නෙස්ලේ නෙස්ටොමෝල්ට් දායක විය. සිය ක්‍රීඩා දිවිය අරඹන අනාගත මලල ක්‍රීඩකයින්ට ධනාත්මක ආරම්භයක් ලබාදීම එමඟින් අරමුණු කෙරිණි.

ප්‍රතිඵල:

කිලෝ මීටර 21 මිනි මැරතන් (පිරිමි)- **(1)** සදීශ අනුසංඛ **(2)** එස්.කීරන් **(3)** ඒ.කේ.ඩී.දිල්හාර ලක්ෂාන්

කිලෝ මීටර 21 මිනි මැරතන් (කාන්තා) - **(1)** ඩබ්.ටී.පී.මධුවන්ති **(2)** ජී.ඩබ්.ඕ.නිලූමිකා **(3)** ඩී.එම්.සී.සිරිවර්ධන

කිලෝ මීටර 5  ධාවන තරගය (පිරිමි) - **(1)** කේ.කේ.එල්.නිර්මාන් **(2)** කේ.වී.පී.හර්ෂණ **(3)** බී.එල්.කේ.තිලාෂ්

කිලෝ මීටර 5  ධාවන තරගය (කාන්තා) - **(1)** ඩබ්.එම්.බී.අමාෂ් **(2)** ඒ.පී.ඩී.ටී.ඩී.කුමාරි **(3)** ඕ.එම්.ඩී.ප්‍රියංකා

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. මෙරට වෙළෙඳපොළේ පවතින නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි අති නවීන නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කෙරේ. නෙස්ලේහි ප්‍රමුඛතම සන්නාමයක් වන නෙස්ටොමෝල්ට් යනු වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය සහ ආදරය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටොමෝල්ට්, ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරය වන අතර, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, විටමින් සහ ඛනිජ ලවණ වලින් සරු කර ඇති අතර ඔබේ ගතට සිතට බලය ජවය ශක්තිය ලබාදෙයි.


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |